මගේ අංකය:-ඩබ්/මත්ද්‍රව්‍ය/කන්දකාඩු/2014

වයාපල්බ අංක :-......31....../2014

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2014-07-31

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ

සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**<u>මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට මාරු කිරීම.</u>**

ඉහත කරුණට අදාළව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2014-07-30 දින අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේදී පැවැත්වූ සාකච්ඡාව හා සම්බන්ධවයි.

02.මෙම සාකච්ඡාවේදී පැන නැගුනු ප්‍රධානතම ගැටළුවක් වූයේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යැවීමට ගරු අධිකරණය නියෝග ලබා දීමෙන් පසුව බන්ධනාගාරය හරහා එකී මධ්‍යස්ථානයට ඔවුන් යැවීමේදී යම් කාලසීමාවක් ගත වන බවය.මේ හේතුවෙන් ඔවුන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන්වලට බාධාකාරී තත්වයක් නිරන්තරයෙන් මතු වන බවත් වාර්තා විය.ඊට පිලියම් ලෙසින් පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට එකී රැස්වීමේදී තීරණය විය.

03.ඒ අනුව මින් ඉදිරියට ඔබ ප්‍රදේශයේ ගරු අධිකරණවලින් කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යැවීමට නියෝග ලබන මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූවන් (එක් අයකු සිටියද ) එකී සති අන්ත සෙනසුරාදාම වැලිකඩ බන්ධනාගාරයට අනිවාර්යයෙන් මාරුකල යුතු අතර වැලිකඩ බන්ධනාගාරයෙන්ද ඊට පසු දින එනම් ඉරිදා දින මොවුන් (එක් අයකු සිටියද ) අනිවාර්යයෙන්ම පොලොන්නරුව බන්ධනාගාරයට මාරු කිරීමට ක්‍රියා කල යුතුය.පොලොන්නරුව බන්ධනාගාරය විසින් වහාම ඔවුන්ව කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත භාර දීමට කටයුතු කිරීමට වගබලා ගත යුතුය.

මේ සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමුකල යුතු අතර වැඩපිළිවෙල සාර්ථක කරගැනීම සඳහා පැහැදිලි ක්‍රමවේදයක් සකස් කරන ලෙසටද දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

<u>පිටපත්:-</u>

1. ලේකම් ,
   පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
   කොළඹ 08. } (කා.දැ.ගැ.පි.)

2.පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්,
   පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය,
   288/12 එල්, රෝයල් ගාර්ඩන්,ශ්‍රී ජයවර්ධනපුර,රාජගිරිය. } (කා.දැ.ගැ.පි.)